
පැරණි ප්‍රාකාරය සංරක්ෂණය කර ඇති අයුරු


අනාගත පරම්පරාවට දැක ගැනීම සඳහා ඉතිරි කරඇති සංරක්ෂණ නොකළ ප්‍රාකාරයේ කොටසක්


සංඝාවාසය ඉදිරිපිට, සංරක්ෂණය වෙමින් පවතින පොකුණක්


මහාවිහාර භූමියෙන් හමුවූ ගල් ඔරුවක්

# මහාවිහාර භූමිය එදා සහ අද

## බොරු කියන්නාට නොකළ හැකි පවක් නැත

– මාබෝපිටියේ විමලඤාණ හිමි

ඇසළ අමාවක පෝද ධම් දේශනාව යටතේ යහපත් වදනෙහි සමාජ විද්‍යාත්මක වටිනාකම පිළිබඳ විමර්ශනයකි. සමාජය තුළ යහපත් සබඳතා ගොඩනැගීමෙහි සහ සුචරිතවත් බව වර්ධනය කිරීමෙහිලා 'සම්මා වාචා' මාර්ගයෙහි උපයෝගීතාව මෙමගින් විමසුමට ලක් කැරේ.

## කෙලෙස් සිඳින තාක්‍ෂණය

– හෙට්ටිමුල්ලේ රාහුල හිමි

ත්‍රිපිටකයේ මජ්ඣිම නිකායේ මූල පණ්ණාසකයේ සඳහන් වන 'සල්ලේඛ' නම් වූ සූත්‍ර දේශනාව පිළිබඳ විග්‍රහයකි. මිනිස් සිතෙහි ඇති කෙලෙස්, මුළුමනින්ම සිඳ දමන බෞද්ධ ප්‍රතිපදව ඇතුළත් විචිත්‍ර දේශනාවක් පිළිබඳ විවරණයකි.

## කණ්ඨක චෛතිය

සුවිශේෂ බෞද්ධ කලා නිර්මාණයක් වශයෙන් අනුරාධපුර මිහින්තලේ පුද බිමෙහි පිහිටි කණ්ඨක චෛත්‍යය පිළිබඳ විමසුමකි.

## ගැඹුරු අරුත් නිරූපණය කළ ධර්ම චක්‍ර සංකේතය

– රොබට් ප්‍රේමදාස උඩුනුවර

බෞද්ධ 'ධම් චක්‍ර' සංකල්පයෙහි හා ධම් චක්‍ර සංකේතයෙහි අන්තර්ගත ගැඹුරු වූත් – සංකීර්ණවූත් අර්ථ නිරූපණ පිළිබඳ විග්‍රහ කිරීමට දරන උත්සාහයකි.

## දිවි මග පහන් කරන මෙත් සිත

– ඒ. එම්. ප්‍රේමරත්න

මිනිස් සමාජයේ යහපත් සබඳතා සහ සදාචාරවත් බවට පදනමක් වශයෙන් සැලකිය හැකි බෞද්ධ විමුක්ති මාර්ගයේ අතුරු ඵලයක් වශයෙන් සකස් වෙතැ'යි සැලකෙන අතිශය මනෝ විද්‍යාත්මක වටිනාකමක් ඇති මෛත්‍රී දහමේ ප්‍රායෝගිකත්වය සහ ලෞකික – ලෝකෝත්තර ඵලදායක බව පිළිබඳ විමර්ශනයකි.

## දිවි මග සරසන සුපසන් වදන

– කුරුණෑගොඩ පියතිස්ස හිමි

බුදු දහමේ දැක්වෙන විමුක්ති මාර්ගය වූ ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි, 'සම්මා වාචා' මාර්ගාංගය පිළිබඳ විමසුමකි. වදනෙන් සිදුවන අකුසලයෙන් වැළකී යහපත් හා ඵලදායී වදන් භාවිතය නිසා පුද්ගලයාටත් – සමාජයටත් සිදුවන යහපත මෙම ලිපියෙන් විග්‍රහ කැරේ.

## අනුරපුරේ මහා විහාර භූමිය එදා සහ අද

– සේනපුර ඩී. නි.

ඓතිහාසික අනුරාධපුර මහා විහාර භූමිය තුළ පිහිටි සිද්ධස්ථාන හා අනෙකුත් පුරා වස්තු පිළිබඳ පුරා විද්‍යාත්මක ගවේෂණ තුළින් හෙළිවන ඓතිහාසික තොරතුරු හා වර්තමානයේ ඒ පිළිබඳ පුරා විද්‍යා ගවේෂණවල තත්ත්වය.

## 'Thisarana' - The Three Refuges

*-by Aryadasa Ratnasinghe*